කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

2017/2018 අධ්‍යයන වර්ෂය

ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පළමු වසර

පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය - (2019 ජූලි/අගෝස්තු

ආර්ථික විද්‍යාව

ECON 21414/ SOST 21434: සූක්ෂම ආර්ථික විද්‍යාව - 1

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. (i) ආර්ථික විද්‍යාව අර්ථ දැක්වීම සඳහා ආර්ථික විද්‍යාඥයන් ගොඩනංවා ඇති විවිධ ප්‍රවේශ සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) 'ආර්ථික විද්‍යාව කලාවකට වඩා විද්‍යාවකි.' විමසන්න. (ලකුණු 05)

(iii) සූක්ෂම ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස දක්වන්න. (ලකුණු 05)

02. (i) සංඛ්‍යාංක උපයෝගිතාව සහ ක්‍රමාංක උපයෝගිතාව අතර වෙනස දක්වන්න. මාර්ෂල්ගේ සංඛ්‍යාංක උපයෝගිතා විශ්ලේෂණය විවේචනයට ලක්ව ඇත්තේ කුමන හේතු නිසා ද? (ලකුණු 10)

(ii) 'පරිභෝජක සමතුලිතය සංරෝධක සහිත උපයෝගිතා උපරිමකරණ ගැටලුවක් ලෙස සැලකිය හැකිය.' සවිස්තරාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

03. (i) උපේක්ෂා වක්‍රය අර්ථ දක්වන්න. උපේක්ෂා වක්‍රවල ගති ලක්ෂණ කවරේ ද? (ලකුණු 05)

(ii) ආන්තික ආදේශන අනුපාතය (MRS) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? පාරිභෝජකයකු පරිභෝජනය කරන භාණ්ඩ දෙක X හා Y නම් $MRS_{xy} = \frac{MU_x}{MU_y}$ බව පෙන්වන්න. (ලකුණු 05)

(iii) ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය යන ඒවායින් අදහස් කරන්නේ කුමක් ද? උපේක්ෂා වක්‍ර විග්‍රහය භාවිතයෙන් මිල වෙනස්වීමක මුළු ප්‍රතිවිපාකය ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක වශයෙන් වෙන් කර දක්වන්න.

(ලකුණු 10)

04. (i) නිෂ්පාදන ශ්‍රිතය අර්ථ දක්වන්න. නිෂ්පාදන ක්‍රියාවලි විග්‍රහයේදී නිෂ්පාදන ශ්‍රිත විශ්ලේෂණය ප්‍රචලිතව යොදා ගැනෙන්නේ ඇයිදැයි විස්තර කරන්න. (ලකුණු 04)

(ii) (අ) නිෂ්පාදන ශ්‍රිතයේ ස්වරූපය $Q = 100K^{1/2}L^{1/2}$ ද C = රු.1200 W = රු.30 සහ r = රු.40 ද වේ. නිෂ්පාදකයාගේ අරමුණ නිමැවුම් මට්ටම උපරිම කිරීම නම් උපරිම නිමැවුමේදී ප්‍රශස්ත සාධක සංයෝගය නිශ්චය කරන්න.

(ලකුණු 06)

(ආ) සමතුලිත නිමැවුම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02)

(ඇ) නිෂ්පාදකයා ඒකක 9100ක් නිෂ්පාදනය කිරීමට තීරණ කළේ නම් පිරිවැය අවම වන ප්‍රශස්ත සාධක සංයෝගය සොයන්න. (ලකුණු 06)

(ඈ) සමතුලිතයේදී මුළු පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02)

05. (i) වැටි රේඛා අර්ථ දක්වා සමනිෂ්පාදිත වක්‍ර සිතියමක් ඇසුරින් ඒවා නිරූපනය කරන්න. නිෂ්පාදන ශ්‍රිත විශ්ලේෂණයේදී ඒවා වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) පහත දැක්වෙන පිරිවැය සංකල්ප පැහැදිලි කර ඒවා ප්‍රස්තාරිකව නිරූපනය කරන්න.

(අ) සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)

(ආ) සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)

(ඇ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC)

(ඈ) ආන්තික පිරිවැය (MC) (ලකුණු 03 බැගින්)

06. (i) ආයතනයක සමතුලිතය යන්නෙන් කුමක් අදහස් වේ ද? පූර්ණතරගකාරී ආයතනයක කෙටිකාලීන සමතුලිත කොන්දේසි ව්‍යුත්පන්න කරන්න. ආන්තික අයභාරය (MR), ආන්තික පිරිවැයට (MC) සමානවීම සමතුලිතය සඳහා ප්‍රමාණවත් වේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) පූර්ණතරගකාරී ආයතනයක කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිතය රූපසටහන් ඇසුරින් පැහැදිලි කරන්න. දිගුකාලීන සමතුලිතයේදී ආයතනය සිය ධාරිතාව පූර්ණ වශයෙන් උපයෝජනය කරන බව පෙන්වන්න. (ලකුණු 12)

07. (i) ඒකාධිකාරී වෙළෙඳපොල තත්ත්වයට අදාළ කොන්දේසි දක්වා ඒවායේ ගම්‍යාර්ථ (implications) පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) ඒකාධිකාරී ආයතනයකට සෑම විටම අතිප්‍රාමාණික ලාභ ලැබිය හැකි ද? එසේ නොහැකි නම් ඒ ඇයි ? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(iii) මිල විශේෂණය (price discrimination) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? මේ මිල ප්‍රතිපත්තිය ඒකාධිකාරී ආයතනයට පමණක් යොදා ගත හැක්කේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)